

PROHIBITION
DOES NOT WORK
තහනම් කිරීම්
අසාර්ථක වන්නේ
ඇයි:
දුමෙන් තොර
ශ්‍රී ලංකාවක්
සඳහා වන
නියාමන

# ප්‍රධාන කරුණු සාරාංශය

ශ්‍රී ලංකාව තුළ වළක්වා ගත හැකි මරණ සඳහා බලපාන ප්‍රධානතම සාධකය ලෙස දුම්කොළ භාවිතය හඳුනාගත හැකිය. මෙරට වැඩිහිටි පිරිමි ජනගහනයෙන් 26.6% ක් පමණ, එනම් මිලියන 1.86 කට ආසන්න පිරිසක් දුම්පානයට යොමු වී සිටිති. මෙරට වාර්ෂිකව සිදුවන සමස්ත මරණවලින් 83% කටම හේතුව බෝ නොවන රෝග (NCDs) ව්‍යාප්තිය මෙම තත්ත්වයට සෘජුවම බලපෑම් සිදු කරනු ලබයි. එබැවින්, මෙහිදී පැනනගින ගැටලු අවම කිරීම සඳහා දැනට පවත්නා ක්‍රමවේදයන්ම අනුගමනය කිරීම වෙනුවට, නවතම දත්ත හා සාක්ෂි මත පදනම් වූ උපායමාර්ගික වෙනසක් සිදු කිරීම අත්‍යවශ්‍ය වේ.

ශ්‍රී ලංකාව පසුගිය දශක දෙකක කාලය පුරා දුම්කොළ පාලනය සම්බන්ධයෙන් දැඩි කැපවීමක් ප්‍රදර්ශනය කර ඇත. දුම්කොළ පාලනය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) දුම්කොළ පාලනය පිළිබඳ පදනම් සම්මුතිය[1] (FCTC) අනුමත කළ (Ratify) ආසියාවේ පළමු වන රට ශ්‍රී ලංකාව වන අතර දුම්කොළ නිෂ්පාදන සඳහා සුරාබදු (Excise Taxes) පැනවීම, වෙළඳ දැන්වීම් සහ අලෙවිකරණ සීමා කිරීම මෙන්ම පොදු ස්ථානවල දුම්පානය තහනම් කිරීම ඇතුළු ප්‍රතිපත්ති රැසක් රට තුළ ක්‍රියාත්මක කර ඇත.[2]

වර්තමානයේදී පවතින ප්‍රධානම ප්‍රතිපත්තිමය අභියෝගය වන්නේ දුම්කොළ භාවිතය පාලනය කිරීමේ අවශ්‍ය ද යන්න නොව, දුම්පානය ප්‍රචලිත වීම තවදුරටත් කඩිනමින් අවම කරන්නේ කෙසේද යන්නයි.

දුම්කොළ පාලනය පිළිබඳ පදනම් සම්මුතියෙහි (FCTC), 1(d) වගන්තිය මගින් "දුම්කොළ පාලනය" යන්නට "හානි අවම කිරීමේ උපායමාර්ග" ද ඇතුළත් වන බව පැහැදිලිව අර්ථ දක්වා ඇත. දියුණු වෙමින් පවතින ජාත්‍යන්තර මගපෙන්වීම් මගින් ද මෙම කරුණු තහවුරු කෙරේ. 2025 දෙසැම්බර් 16 දිනැති බෝ නොවන රෝග පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රකාශනය මගින් විකල්ප නිකොටින් නිෂ්පාදන තහනම් කරනවා වෙනුවට ඒවා නියාමනය කිරීම සඳහා සහය පළ කර ඇත.[3] 2026 මාර්තු මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) නිර්දේශ කර සිටිනු ලැබුවේ, අඩු අවදානමක් සහිත නිකොටින් නිෂ්පාදනවල පවතින අවම හානිකර ස්වභාවය හේතුවෙන් එම නිෂ්පාදන සඳහා සිගරට්වලට වඩා අඩු බදු පැනවිය යුතු බවය.[4] එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ කාර්යාලය (UNODC)[5] සහ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය[6] ඇතුළු අනෙකුත් එක්සත් ජාතීන්ගේ ආයතන ද හානි අවම කිරීම යන්න මහජන සෞඛ්‍ය ප්‍රතිපත්තීන් වල කේන්ද්‍රීය අංගයක් ලෙස අවධාරණය කරයි.

මෙම සාක්ෂි පිළිගනිමින් ක්‍රියාත්මක වූ රටවල් ලෙස එක්සත් රාජධානිය, ස්වීඩනය සහ

[1] WHO Framework Convention on Tobacco Control 2025

[2] ගෘහස්ථ පොදු ස්ථාන, සේවා ස්ථාන සහ පොදු ප්‍රවාහන සේවා දුම් පානයෙන් තොර තත්ත්වයට පත් කර ඇත.

[3] https://docs.un.org/en/A/80/L.34

[4] Taxing Harmful Habits

[5] unodc.org/documents/dlssb/Drugpolicynotes/UNODC_Harm_reduction_policy_note_2024_1.pdf

[6] https://docs.un.org/en/A/HRC/56/52#:~:text=10.,those%20rooted%20in%20harm%20reduction

නවසීලන්තය යන රටවල්, ගෝලීය වශයෙන් දුම්පානය කරන්නන්ගේ අගය ශීඝ්‍රයෙන් පහත හෙළීමට සමත් වී ඇත. මෙම සාර්ථක ප්‍රතිඵල අත්කර ගැනීමට හැකි වී ඇත්තේ අවදානම අඩු නිකොටින් නිෂ්පාදනවලට සිගරට් නිෂ්පාදනයන් සමඟ තරඟ කිරීමට සහ ඒවා ප්‍රතිස්ථාපනය කිරීමට ඉඩ සලසන නියාමන රාමු සකස් කිරීම මගිනි.

ශ්‍රී ලංකාව මේ වන විට මෙයට ප්‍රතිවිරුද්ධ දිශාවකට ගමන් කරමින් සිටී. වේප් නිෂ්පාදන (Vapour products) තහනම් කිරීම මගින් ඉල්ලුම නැති නොවන බවට පැහැදිලි සාක්ෂි තිබියදීත්, ප්‍රතිපත්තිමය සාකච්ඡා වැඩි වශයෙන් යොමු වී ඇත්තේ එම නිෂ්පාදන තහනම් කිරීම සඳහාය. එලෙස තහනම් කිරීම මගින් සිදුවන්නේ මෙම නිශ්පාදන වලට ඉල්ලුම නැති වීම නොව, එම නිෂ්පාදන ලබා ගැනීම සඳහා නීති විරෝධී වෙළඳපොළවල් වෙත යොමු වීමයි. වේප් නිෂ්පාදන මේ වන විටත් විධිමත් නොවන ක්‍රම සහ අන්තර්ජාලය ඔස්සේ බහුලව ලබා ගැනීමට හැකි අතර, එමගින් පෙනීයන්නේ මෙම නිෂ්පාදන තහනම් කිරීම මගින් ඒවාට ප්‍රවේශය වැළැක්විය නොහැකි බවත්, ඒ වෙනුවට සිදුවන්නේ මෙම නිෂ්පාදන රජයේ නියාමන අධීක්ෂණයෙන් ඉවත් වීම පමණක් බවත්ය.

මෙමගින් පැහැදිලි ප්‍රතිපත්තිමය තේරීමක් උද්ගත වේ. ඒ අනුව ශ්‍රී ලංකාවට නීති විරෝධී වෙළඳපොළවල් ව්‍යාප්ත කරන, පාරිභෝගික ආරක්ෂාව දුර්වල කරන සහ නියාමන පාලනය අහිමි කරන තහනම් කිරීමේ ප්‍රවේශය තවදුරටත් ඉදිරියට ගෙන යා හැකිය; ඒසේ නැතහොත් නියාමන අධීක්ෂණය පවත්වා ගනිමින් හානිය අවම කරන නියාමන රාමුවක් අනුගමනය කළ හැකිය.

සිගරට් බහුලව ලබා ගැනීමට ඉඩ සලසවමින්, අවදානම අඩු විකල්ප නිෂ්පාදන තහනම් කරන ප්‍රතිපත්ති මගින් හානිය අවම නොවන අතර, ඒ වෙනුවට සිදුවන්නේ එම හානිකර තත්ත්වය තවදුරටත් ස්ථාවර වීමයි.

නිසි නියාමන ප්‍රවේශයක් මගින් පහත දේ සඳහා විශ්වාසදායක මාර්ගයක් සපයයි:

- **දහනය කළ හැකි දුම්කොළ භාවිතයෙන් ඉවත් වීමට උත්සාහ කරන වැඩිහිටි දුම්පානය කරන්නන්ට සහය වීම.**
- **බලාත්මක කළ හැකි වයස් සීමාවන් පැනවීම මගින් තරුණ පරපුර ආරක්ෂා කිරීම.**
- **නිෂ්පාදනවල ආරක්ෂාව සහ ගුණාත්මක ප්‍රමිතීන් පවත්වාගෙන යාම.**
- **නීති විරෝධී වෙළඳපොළවල් ව්‍යාප්ත වීම වැළැක්වීම.**

මෙහිදී ඇති තේරීම පවතින්නේ වේප් නිෂ්පාදන භාවිතය සහ භාවිත නොකිරීම අතර නොව, නියාමනය කරන ලද වෙළඳපොළ සහ නිතිවිරෝධී වෙළඳපොළ අතර වේ.

මේ වන විට ශ්‍රී ලංකාව තීරණාත්මක ප්‍රතිපත්තිමය තේරීමකට මුහුණ දී සිටියි: එනම්, නීති විරෝධී සැපයුම් දාමයන් ශක්තිමත් වීමේ අවදානම සහිත තහනම් කිරීමේ ප්‍රවේශයක් අනුගමනය කරන්නේ ද, නැතහොත් වෙළඳපොළ පිළිබඳ අධීක්ෂණය පවත්වා ගනිමින් මහජන සෞඛ්‍යය ආරක්ෂා කරන නියාමන රාමුවක් ක්‍රියාත්මක කරන්නේ ද යන්නයි.

# වේප් නිෂ්පාදන සහ දුම්පානය නිසා ඇතිවන සෞඛ්‍ය ගැටලු

වේප් නිෂ්පාදන (Vapour products) සිගරට්වලට වඩා මූලික වශයෙන් වෙනස් වේ. එම නිෂ්පාදන වල දුම්කොළ අඩංගු නොවන අතර දහනයක් ද සිදු නොවේ. දුම්පානය ආශ්‍රිත රෝග ඇති කරන විෂ ද්‍රව්‍ය නිපදවීමට ප්‍රධාන වශයෙන්ම බලපාන්නේ මෙම දහන ක්‍රියාවලියයි.[7]

නිකොටින් යනු ඇබ්බැහිකාරක ද්‍රව්‍යයක් වුවද, දුම්පානය ආශ්‍රිත රෝග ඇති කරන සාධකයක් නොවේ.[8] වේප් නිෂ්පාදන භාවිත කරන්නන්, දහනය වන සිගරට් භාවිතා කරන්නන්ට වඩා ඉතා අවම මට්ටමකින් අහිතකර රසායනික ද්‍රව්‍යවලට නිරාවරණය වන බව ස්වාධීන විද්‍යාත්මක සාක්ෂි මගින් තහවුරු වී ඇත.[9] එක්සත් රාජධානියේ සෞඛ්‍ය වැඩිදියුණු කිරීම් සහ අසමානතා පිළිබඳ කාර්යාලය (UK's Office for Health Improvement and Disparities - OHID) සහ නවසීලන්ත සෞඛ්‍ය අමාත්‍යාංශය[10] වැනි පිළිගත් ආයතන පෙන්වා දෙන්නේ, මෙම නිෂ්පාදන දුම්පානයට වඩා සැලකිය යුතු ලෙස ආරක්ෂිත බවත්, දුම්පානය අත්හැරීම සඳහා ඵලදායී ආධාරක ලෙස ක්‍රියා කළ හැකි බවත්, ඒ අනුව දුම්කොළ භාවිතය නිසා ඇතිවන මහජන සෞඛ්‍ය ගැටලු මේ හරහා විශාල වශයෙන් අඩු කර ගත හැකි බවත් ය. එබැවින්, බොහෝ රටවල් අවදානම අඩු ලෙස සැලකෙන නිකොටින් නිෂ්පාදන සිය පුළුල් දුම්කොළ පාලන රාමුවලට ඇතුළත් කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස එම රටවල් දුම්කොළ භාවිතය සහ රෝග සම්බන්ධ ගැටලු සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

නැවත නැවතත් සිදුකළ සමාලෝචන මගින් තහවුරු වූ සාක්ෂි මගින් මෙම නිගමනය තහවුරු වේ. එංගලන්ත මහජන සෞඛ්‍ය ආයතනය (Public Health authorities)[11] සහ ඒ හා සම්බන්ධ අනෙකුත් ආයතන විසින් සිදුකරන ලද ස්වාධීන පර්යේෂණ විශ්ලේෂණයන් පාදක කරගනිමින්, එක්සත් රාජධානියේ මහජන සෞඛ්‍ය බලධාරීන් නිගමනය කර ඇත්තේ වේප් නිෂ්පාදන භාවිතය (Vaping), දුම්පානයට වඩා දළ වශයෙන් 95% කින් හානිකර බවින් අඩු බවයි. එමෙන්ම, සාක්ෂි මත පදනම් වූ වෛද්‍ය විද්‍යාවේ ස්වර්ණමය ප්‍රමිතිය ලෙස සැලකෙන 'කොක්රේන් පුස්තකාලය' (The Cochrane Library) විසින් සිදුකරන ලද අධ්‍යයනයන්ට අනුව සොයාගෙන ඇත්තේ, දුම්පානය නතර කිරීමට උත්සාහ කරන්නන් සඳහා සාම්ප්‍රදායික නිකොටින් ප්‍රතිස්ථාපන ප්‍රතිකාරවලට වඩා නිකොටින් වේප් නිෂ්පාදන බෙහෙවින් ඵලදායී වන බවය.

මෙම සොයාගැනීම් ප්‍රතිපත්තිමය වශයෙන් ක්‍රියාවට නැංවූ රටවල්, කැපීපෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කර තිබේ. විශේෂයෙන්ම, අඩු අවදානමක් සහිත නිකොටින් නිෂ්පාදන බහුලව ලබා දීම වැනි, දුම්කොල ආශ්‍රිත හානි අවම කිරීමේ ක්‍රමවේද (Harm reduction approaches) අනුගමනය කළ ස්වීඩනය, මේ වන විට යුරෝපයේ පළමු " දුමෙන් තොර" (Smoke-free) රට බවට පත්වෙමින් පවතී. එහි දුම්පානය කරන පිරිස 5%ට වඩා අඩු මට්ටමක් දක්වා පහත වැටී ඇත. එසේම, තම දුම්කොළ පාලන උපායමාර්ගයට 'වේප් භාවිතය' (Vaping) ඒකාබද්ධ කිරීම මගින් නවසීලන්තය තුළ ද දුම්පානය කරන්නන්ගේ සංඛ්‍යාව ඉතා සීඝ්‍රයෙන් පහත වැටී ඇත.

මෙම ප්‍රතිඵල නිරීක්ෂණය කිරීම මගින් නිශ්චිත රටාවක් පෙන්නුම් කරයි: එනම්, අවදානම අඩු විකල්ප නිෂ්පාදන භාවිතයට ඉඩ සලසා දීම සහ ඒවා නිසි ලෙස නියාමනය කිරීම මගින් දුම්පානය කරන පිරිස ඉතා වේගයෙන් අඩු කරගත හැකි බවය.

[7] Content of toxic components of cigarette, cigarette smoke vs cigarette butts: A comprehensive systematic review, Science Direct, 2022

[8] Nicotine Without Smoke, Royal College of Physicians, 2016

[9] Nicotine Vaping in England: An Evidence Update Including Health Risks and Perceptions, Office for Health Improvements and Disparities, 2022

[10] Our Position on Vaping, New Zealand Ministry of Health, 2025

[11] Nicotine Vaping in England: An Evidence Update Including Health Risks and Perceptions, Office for Health Improvements and Disparities, 2022

දුම්කොළ අඩංගු නොවන නිකොටින් පවුච් (Nicotine pouches) සහ වේප් වැනි අවදානම අඩු විකල්ප නිෂ්පාදන නියාමනය කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් ශ්‍රී ලංකාවට ද විශාල ප්‍රතිලාභ ලබාගත හැකිය. 2020 ඇස්තමේන්තුවලට අනුව, ශ්‍රී ලංකාවේ වැඩිහිටි පිරිමි ජනගහනයෙන් ආසන්න වශයෙන් 26.6% ක් එනම් පිරිමින මිලියන 1.86 ක් පමණ තවමත් දුම්පානය කරති.[12] මෙරට සිදුවන සමස්ත මරණවලින් 83% කටම හේතුවන බෝ නොවන රෝග (NCD) ව්‍යාප්ත වීමට ප්‍රධානතම සාධකයක් වී ඇත්තේ ද මෙම දුම්කොළ භාවිතයයි.[13]

ශ්‍රී ලංකාව තුළ සිගරට් භාවිතය සහ බහුලව සිදුවන බීඩි භාවිතය, ප්‍රධාන රෝග රැසකට හේතුවන ප්‍රබල අවදානම් සාධකයකි. ශ්‍රී ලංකාව තුළ හෘද වාහිනී රෝග (Cardiovascular disease) ඇතිවීමට බලපාන ප්‍රධානතම හේතුව වන අධික රුධිර පීඩනයට පසුව, දෙවන ප්‍රධානතම අවදානම් සාධකය වන්නේ දුම්කොළ භාවිතයයි. එය හෘදයාබාධ (Ischaemic heart disease), අංශභාගය (Stroke) සහ නිදන්ගත පෙනහළු අවහිරතා රෝග (COPD) වැනි තත්ත්වයන් සඳහා විශාල වශයෙන් දායක වේ. එමෙන්ම, නිදන්ගත ශ්වාසනාල ප්‍රදාහය (Chronic bronchitis) සහ ඇදුම වැනි ශ්වසන පද්ධතිය ආශ්‍රිත රෝගී තත්ත්වයන් ඇතිවීමට මූලිකම හේතුව වන්නේ ද දුම්කොළ භාවිතය වේ.[14] මීට අමතරව, නියුමෝනියාව (pneumonia) සහ ක්ෂය රෝගය (tuberculosis) වැනි බෝවන රෝගවලට ගොදුරු වීමේ ප්‍රවණතාව ඉහළ යෑමට දුම්කොළ භාවිතය සෘජුවම බලපෑම් ඇති කරයි.[15]

මෙරට පිළිකා ප්‍රවණතා නිරීක්ෂනය මගින් සිගරට් සහ බීඩි භාවිතයේ දරුණු බලපෑම ද මැනවින් පිළිඹිබු වේ. ශ්‍රී ලාංකාවේ පිරිමි ජනගහනය අතර දෙවනුවට බහුලවම දක්නට ලැබෙන පිළිකා වර්ගය වන්නේ පෙනහළු පිළිකාව වන අතර,2005 සිට 2021 දක්වා කාලය තුළ එහි ව්‍යාප්තිය දෙගුණයකටත් වඩා වැඩි වී ඇත.[16] මීට අමතරව තොල්, දිව, මුඛය, පෙනහළු, අන්නස්‍රෝතය (Oesophagus), ග්‍රසනිකාව (Pharynx), මුත්‍රාශය සහ ගලනාලය (Larynx) ආශ්‍රිතව ශ්‍රී ලාංකික පිරිමින්ට වැළඳෙන බහුල පිළිකා වර්ග බොහොමයක් දුම්කොළ භාවිතය හේතුවෙන් ඇතිවීමට ඇති ඉහළ ප්‍රවණතාවක් පවතී.[17]

දුම්කොළ භාවිතයෙන් සිදුවන ජීවිත හානිය මෙන්ම,එය ජාතික ආර්ථිකයට ද දැඩි බලපෑමක් එල්ල කරයි. ජාතික ඇස්තමේන්තුවලට අනුව, දුම්කොළ භාවිතය ආශ්‍රිත පිළිකා රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා වාර්ෂිකව රුපියල් බිලියන 16.3 ක් (ඇමරිකානු ඩොලර් මිලියන 121 ක්) පමණ වැය වේ. එමෙන්ම, දුම්කොළ භාවිතය නිසා ඇතිවන අනෙකුත් බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර කිරීමට වසරකට රුපියල් බිලියන 73 ක (ඇමරිකානු ඩොලර් මිලියන 540 ක) පමණ අතිවිශාල පිරිවැයක් දැරීමට සිදු වේ.[18]

මෙහිදී වටහාගත යුතු සහ නීතිමය වශයෙන් වෙන් කර හඳුනාගත යුතු ප්‍රධානතම කරුණ වන්නේ, සෞඛ්‍ය ගැටලු ඇති කරන 'දුම්වැටි භාවිතය' (දුම්පානය) සහ 'නිකොටින්' (සෞඛ්‍ය ගැටලුවලට සෘජු හේතුව නොවන) අතර පවතින වෙනසයි. පවතින දුම්කොළ පාලන ප්‍රතිපත්ති මගින් සැලකිය යුතු ප්‍රගතියක් ලබා තිබුණද, දුම්කොළ නිෂ්පාදන තවමත් ශ්‍රී ලාංකීය සමාජයේ සෞඛ්‍යයට සහ ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ල කරයි. දුම්පානය කරන පිරිස තවදුරටත් සීඝ්‍රයෙන් අඩු කිරීමට අපේක්ෂා කරන සහ කිසිදු ගුණාත්මක හෝ ප්‍රමිතියකට අනුකූල නොවන අමුද්‍රව්‍ය සහ අනතුරුදායක විය හැකි නීති විරෝධී නිෂ්පාදන ව්‍යාප්ත වීම වැළැක්වීමට උත්සාහ කරන ප්‍රතිපත්ති සම්පාදකයින්ට, නියාමනය කරන ලද 'අවදානම අඩු නිකොටින් විකල්ප' (Lower-risk nicotine alternatives) හඳුන්වා දීම ඉතා වැදගත් ප්‍රතිපත්තිමය විකල්පයකි. ගෝලීය වශයෙන් නිරීක්ෂණය වී ඇති කරුණක් වනුයේ, තහනම් කිරීමට වඩා විධිමත් 'නියාමනය' (Regulation) මගින් තරුණ පරපුර හෝ බාලවයස්කාර දරුවන් මෙවැනි දේට යොමු වීම වඩාත් සාර්ථකව වැළැක්විය හැකි බවයි.

[12] Global Adult Tobacco Survey – Sri Lanka Report 2019/2020,

[13] WHO global report on trends in prevalence of tobacco use, World Health Organisation, 2025

[14] Say No to Tobacco / Be Free from Tobacco II: National Strategic Plan on Tobacco Control, Ministry of Health Sri Lanka, 2018

[15] Say No to Tobacco / Be Free from Tobacco II: National Strategic Plan on Tobacco Control, Ministry of Health Sri Lanka, 2018

[16] Annual Health Bulletin 2022–2023: Cancer incidence and tobacco-related disease trends, Ministry of Health Sri Lanka

[17] Annual Health Bulletin 2022–2023: Cancer incidence and tobacco-related disease trends, Ministry of Health Sri Lanka

[18] Global Adult Tobacco Survey – Sri Lanka Report 2019/2020, Ministry of Health of Sri Lanka, May 2023

# වේප් නිෂ්පාදන (VAPOUR PRODUCTS) සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නියාමන ප්‍රවේශය

අනෙකුත් බොහෝ විදේශීය රටවල්වලින් වෙනස්ව, 2010s වර්ෂය තුළ දුම් රහිත දුම්කොළ නිෂ්පාදන කරළියට පැමිණීමට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාව විසින් ඒ සම්බන්ධව තහනම් කිරීමේ නියාමන ප්‍රවේශයක් (Prohibitionist regulatory approach) අනුගමනය කරන ලදී. ඒ අනුව, 2016 වසරේදී රජය විසින් 'තහනම් දුම්කොළ නිෂ්පාදන රෙගුලාසි'[19] හඳුන්වා දුන් අතර, එහි සඳහන් වන්නේ:

> **"කිසිදු පුද්ගලයෙකු විසින් දුම් රහිත කිසිදු දුම්කොළ නිෂ්පාදනයක් දුම්කොළ අඩංගු කිසිදු විද්‍යුත් සිගරට්ටුවක් [හෝ] ... (E-CIGARETTE) නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම හෝ විකිණීම සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතුය"**

### වේප් නිෂ්පාදන (Vapour products) සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නියාමන ක්‍රියාමාර්ග පිළිබඳ කාලරාමුව

| | |
|---|---|
| **2016** | • තහනම් දුම්කොළ නිෂ්පාදන රෙගුලාසි මගින් දුම්කොළ අඩංගු විද්‍යුත් සිගරට් (e-cigarettes) තහනම් කිරීම. |
| **2023** | • සෞඛ්‍ය බලධාරීන් විසින් අන්තර්ජාල වේදිකා (online platforms) හරහා තරුණයන්ගේ ප්‍රවේශය ඉහළ යාම පිළිබඳව අනතුරු ඇඟවීම. |
| **2025** | • නීතිය බලාත්මක කිරීමේ අසාර්ථකත්වයන් පිළිබඳව පාර්ලිමේන්තු පරීක්ෂණයකදී කරුණු අවධාරණය වීම. |
| **2026** | • සීමා කිරීම් තවදුරටත් දැඩි කරන ලෙස නියාමන ආයතනය ඉල්ලා සිටීම. |

ඇතැම් වෙළෙන්දන් විසින් ප්‍රශ්න කරනු ලැබුවේ තම නිෂ්පාදන මුල් අවස්ථාවේ සිදු කරන ලද තහනමේ විෂය පථයට අයත් නොවන බවයි. මෙම සීමාව වඩාත් පැහැදිලි වූයේ 2023 වසරේදී වන අතර, එහිදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා ඒකකය අනතුරු ඇඟවූයේ අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය හරහා ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් අතර වේප් නිෂ්පාදන (vaping products) ජනප්‍රිය වෙමින් පවතින බවයි.[20]

කෙසේ වෙතත්, මෙම නියාමන රාමුව වෙළඳපොළ වර්ධනයනට සමගාමීව වර්ධනය වී නොමැති අතර, වෙළඳපොළ පරිණාමය වීමත් සමඟ 2016 වසාරේදී පැවති නියාමනරාමුවේ පවතින සීමාවන් වඩ වඩාත් පැහැදිලි විය. මෙම රෙගුලාසිය විශේෂයෙන්ම දුම්කොළ අඩංගු විද්‍යුත් සිගරට් (e- cigarette) සඳහා අදාළ වන බැවින්, එම අර්ථ දැක්වීමට පැහැදිලිවම ඇතුළත් නොවන නවීන නිෂ්පාදන සඳහා එය අදාළ වන්නේ කෙසේ ද යන්න පිළිබඳව ගැටලුවක් මතු වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, නිෂ්පාදන නවෝත්පාදනයන් මුල් නියාමන සැලසුම අභිබවා ගොස් ඇති බැවින්, ප්‍රායෝගිකව නීතිය ස්ථාවර ලෙස ක්‍රියාත්මක කිරීමේදී සහ බලාත්මක කිරීමේදී ඉහළ යමින් පවතින අභියෝග වලට බලධාරීන් මුහුණ දී සිටී.[21]

[19] Prohibited Tobacco Products Regulations, Gazette of the Democratic Socialist Republic of Sri Lanka, 2016

[20] Weekly Epidemiological Report, Sri Lanka Ministry of Health, Nutrition & Indigenous Medicine, 2023

[21] Vaping is 'illegal,' but where is the law? The Morning, 2025

2025 වසරේදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාව (COPF) විසින් පවත්වන ලද පරීක්ෂණයකදී මෙම අභියෝග පිළිබඳව පාර්ලිමේන්තුවේ දැඩි අවධානයට ලක් වූ අතර, එහි සභිකවරුන් විසින් පෙන්වා දෙනු ලැබුවේ මෙවැනි නිෂ්පාදන නීති විරෝධී ලෙස වෙළඳපොළට ඇතුළු වුව ද, සැලකිය යුතු ප්‍රමාණයක වේප් නිෂ්පාදන වෙළඳපොළක් ක්‍රියාත්මක වන බවයි. වැටලීම් හරහා භාණ්ඩ අත්අඩංගුවට ගැනීම් සිදු වුවද, සාර්ථක ලෙස නඩු පැවරීම් සිදුවන්නේ ඉතා අඩුවෙන් බව නිලධාරීන් තහවුරු කළ අතර, එයින් පැහැදිලි වන්නේ පැහැදිලි සහ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි නීතිමය රාමුවක පවතින හිඟකමයි.[22]

> **අඩු අවදානම් සහිත විකල්ප පවතින විට සහ ඒවා යෝග්‍ය ලෙස නියාමනය කර ඇති විට, දුම්පානය කිරීම වේගයෙන් පහළ යාමක් දක්නට ලැබේ.**

මෙම ප්‍රවේශය හේතුවෙන් වර්තමානයේ දී පහත ආකාරයෙන් ප්‍රතිඵල තුනක් ජනිත වී ඇත:

- නීතිමය ව්‍යාකූලතාවය
- නීති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතාවය
- වර්ධනය වෙමින් පවතින නීති විරෝධී වෙළඳපොළ

මෙවැනි පසුබිමක් පවතින අවස්ථාවක, බලධාරීන් විසින් මේ වන විට මෙම සීමා කිරීම් තවදුරටත් දැඩි කිරීමට සලකා බලමින් සිටී. දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA) පෙන්වා දී ඇත්තේ, විද්‍යුත් සිගරට් (e-cigarette) සම්බන්ධයෙන් පවතින නීති ශක්තිමත් කිරීම සඳහා සහ මෙම නිෂ්පාදන අඛණ්ඩව අන්තර්ජාලය හරහා ප්‍රචලිත කිරීම වැළැක්වීමේ අරමුණින් පනතට සංශෝධන එක් කිරීම පිළිබඳව සාකච්ඡා වෙමින් පවතින බවයි.[23] කෙසේ වෙතත්, දැනට පවතින නීතිමය රාමුවේ ව්‍යුහමය දුර්වලතා විසඳීම වෙනුවට, මෙම යෝජනා මගින්, ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම දැනටමත් දුෂ්කර බව ඔප්පු වී ඇති සහ ශ්‍රී ලංකාවට දැනටමත් සැලකිය යුතු අහිතකර ප්‍රතිවිපාක ඇති කර දී ඇති ප්‍රතිපත්තිමය ප්‍රවේශයේ අවදානම තවදුරටත් දෙගුණ කරයි.

[22] Is Vaping illegal in Sri Lanka? COPF questioned, Newswire, 2025

[23] Tobacco control: NATA Act to be amended, The Morning, 2026

# තහනම් ප්‍රතිපත්ති මගින් නීති විරෝධී වේප් නිෂ්පාදන වෙළඳපොළ ශක්තිමත් වන ආකාරය

අපේක්ෂා කළ පරිදි, වේප් නිෂ්පාදන අලෙවිය තහනම් කිරීම සඳහා ගෙන ඇති පියවර ශ්‍රී ලංකාව තුළ පවතින ඉල්ලුම පාලනය කිරීමට සමත්ව ඇත්තේ ඉතා අල්ප වශයෙනි. මෙම තහනම් කිරීම් මගින් නිකොටින් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම සම්පූර්ණයෙන් තුරන් නොවන අතර, සිදු වන්නේ එම ඉල්ලුම සඳහා නීති විරෝධී වෙළඳපොළ වෙත යොමු වීමයි. ශ්‍රී ලංකාව තුළ මෙම ක්‍රියාවලිය දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. නාමිකව තහනම් කර තිබුණද, අවිධිමත් සිල්ලර වෙළඳ ජාල සහ අන්තර්ජාල වේදිකා හරහා වේප් නිෂ්පාදන අවශ්‍ය ප්‍රමාණයෙන් ලබා ගැනීමට හැකියාව ඇත.

මෙම රහසිගත වෙළඳාම නීති විරෝධී විකුණුම්කරුවන්ට ලාභදායී ආදායම් මාර්ගයක් වී ඇති අතර, එමගින් මහජන සෞඛ්‍ය සම්බන්ධ අරමුණු පළුදු කරන අතරම, පරීක්ෂාවට ලක් නොකළ සහ අනතුරුදායක නිෂ්පාදන ව්‍යාප්ත වීමටද අනුබල දෙයි. නීති විරෝධී නිකොටින් වෙළඳපොළවල් හිතිකර ඒවා නොවේ. ජාත්‍යන්තර වශයෙන් පවතින අත්දැකීම්වලින් පෙනී යන්නේ, බදු නොගෙවන සහ නියාමනය නොකරන ලද නිෂ්පාදන හරහා ආදායම් ඉපයීම සඳහා පවතින නියාමන රාමුවෙහි ඇති හිඩැස් ප්‍රයෝජනයට ගන්නා සංවිධානාත්මක අපරාධ ජාලයන් සමඟ නීති විරෝධී විකුණුම්කරුවන් නිරන්තරයෙන්ම සම්බන්ධ වී ඇති බවයි. මේ අනුව,මෙම තහනම් කිරීම මගින් මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් ඇති අරමුණු අඩපණ වනවා පමණක් නොව, නීති විරෝධී සැපයුම් දාමයන් සක්‍රීයව ශක්තිමත් කිරීම ද සිදු වේ.

> “තහනම් කිරීම් මගින් නිකොටින් නිෂ්පාදන සඳහා වන ඉල්ලුම තුරන් නොවන අතර, එමගින් සිදු වන්නේ එම ඉල්ලුම සඳහා නීති විරෝධී වෙළඳපොළවල් වෙත යොමු වීමයි.”

මෙම නිෂ්පාදන සාමාන්‍යයෙන් විදේශයන්හි සිට ශ්‍රී ලංකාවට නීත්‍යානුකූල නොවන මාර්ග මගින් ගෙන එනු ලබන අතර, නීති විරෝධී බඩු තොග සඳහා ප්‍රධාන සැපයුම් මූලාශ්‍ර සහ ගමන් මාර්ග මධ්‍යස්ථාන ලෙස චීනය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයද නිරන්තරවෙන්ම වාර්තා වේ. එමෙන්ම වේප් නිෂ්පාදන නිරන්රයෙන්ම ගුවන් තොටුපළෙහි අතින් රැගෙන යන ගමන් මලු (Hand-carried luggage) තුළ තිබී සොයා ගැනෙන අතර[24], 2025 වසරේදී සිදු කරන ලද එක් මෙහෙයුමකදී දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් 25,000ක් වටිනා නිෂ්පාදන තොගයක් අත්අඩංගුවට ගත් බව වාර්තා වේ[25]. කෙසේ වෙතත්, සම්පූර්ණයෙන්ම වෙනත් භාණ්ඩ ආකාරයට අසත්‍ය ලෙස ප්‍රකාශ කරමින් වාණිජ නැව් හරහා ප්‍රවාහනය කිරීම මගින් වඩා විශාල ප්‍රමාණයෙන් මෙම නිෂ්පාදන රටට ඇතුළු වන බවට සාක්ෂි පවතී.[26] මෙය බොහෝ විට නීති විරෝධී දුම්කොළ සහ මත්පැන්

[24] Passenger caught smuggling branded fags, e-cig chargers, Ceylon Today, 2025

[25] Sri Lankan Customs Seize Illegal E-Cigarettes and Cigarettes, TIMES Online, 2024

[26] Vaping is ‘illegal,’ but where is the law? The Morning, 2025

සමඟ ද සිදු වන අතර, එවැනි භාණ්ඩ විවිධ අවස්ථාවන්වල දී හුණු බැරල්[27], ගෘහ භාණ්ඩ[28], තුවා සහ ප්ලාස්ටික් කෝප්ප[29] වැනි භාණ්ඩ තොගවල සඟවා තිබී සොයාගෙන ඇත.

මෙහි ප්‍රතිඵලය වන්නේ නියාමන අධීක්ෂණයෙන් සම්පූර්ණයෙන්ම බැහැර වූ, නියමිත නිෂ්පාදන ප්‍රමිතීන් නොමැති, වයස් සීමාවන් හෝ බදු අය කිරීම් අදාළ නොවන සමාන්තර වෙළඳපොළක් (parallel market) ක්‍රියාත්මක වීමයි. රට තුළට ගෙන ආ පසු, ඇතැම් නිෂ්පාදන මෙම නීති විරෝධී ක්‍රියාවලියට හවුල් වන සිල්ලර වෙළෙන්දන්ගේ විසිරුණු ජාලයක් හරහා බෙදා හරිනු ලැබේ. කෙසේ වෙතත්, වර්තමානය වන විට මෙම වෙළඳාම වැඩි වශයෙන් අන්තර්ජාලය වෙත යොමු වී ඇත. ෆේස්බුක්, වෘත්තීය මට්ටමේ ඊ-වාණිජ් වෙබ් අඩවි සහ වට්ස්ඇප් සමූහයන්[30] විශාල ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයන් සඳහා ප්‍රසිද්ධියේ වේප් නිෂ්පාදන ප්‍රචාරණය කිරීම සිදු කරයි. ශ්‍රී ලංකා රේගු දත්ත වලට අනුව, කිසිදු වේප් උපාංගයක් නීත්‍යානුකූලව රට තුළට ආනයනය කර නොමැත.[31] මෙම අන්තර්ජාල වේදිකා (platforms) බොහෝ විට නිෂ්පාදන නාමාවලි (product catalogue) ලබාදෙමින්, භාණ්ඩ නිවසටම ගෙන්වා දීමේ සේවා සහ ඇණවුම් සඳහා ඍජු පණිවිඩ හුවමාරු පහසුකම් ලබා දෙමින් තමන් නීත්‍යානුකූල වෙළෙන්දන් ලෙස පෙනී සිටියි. මෙම වේදිකාවල දක්නට ලැබෙන අලෙවිකරණ උපක්‍රම බොහොමයක් සැලසුම් සහගත ලෙස තරුණ පරපුර ඉලක්ක කරගත් ඒවා බව පෙනේ; ඒවායේ දීප්තිමත් වර්ණවලින් යුත් උපාංග, කාටූන් මාදිලියේ රූප සහ පැනිරස  හෝ සිසිල් බීමවලට සමාන රසයන් සහිත නම් (flavor names) භාවිත කර ඇති අතර, ඇතැම් උපාංගවල සජීවීකරණ (animations) හෝ සරල ක්‍රීඩා පෙන්විය හැකි තිර පවා අන්තර්ගත වේ.

> “මෙහි ප්‍රතිඵලය වන්නේ නියාමන අධීක්ෂණයෙන් සම්පූර්ණයෙන්ම බැහැර වූ, නිෂ්පාදන ප්‍රමිතීන්, වයස් සීමාවන් හෝ බදු අය කිරීම් අදාළ නොවන සමාන්තර වෙළඳපොළක් (PARALLEL MARKET) ක්‍රියාත්මක වීමයි.”

මෙවැනි නිෂ්පාදන තහනමක් යටතේ වෙළඳපොළෙන් සම්පූර්ණයෙන් ඉවත් වීමක් සිදු වන්නේ නැත. ප්‍රගතිශීලී නියාමනයක් මගින්, වැඩිහිටි දුම්පානයකරන්නන්  හට ඉහළ ගුණාත්මක හා ආරක්ෂිත ප්‍රමිතීන්ට යටත් වූ, බලාත්මක කළ හැකි විකුණුම් වයස් සීමා නීති සහිත නියාමනය කළ නිෂ්පාදන සඳහා ප්‍රවේශය ලබා දිය හැකිය; එමගින් පාලනයකින් තොර සහ නුසුදුසු නිෂ්පාදන සඳහා වන ඉල්ලුම සහ ඒවායේ ගලා ඒම තුරන් කළ හැකිය.

[27] LNP - Customs seizes illegally imported cigarettes worth Rs. 31.5mln, Lanka News Papers, 2025
[28] Foreign cigarettes and whiskey bottles worth over Rs. 24 million seized, ADA Derana, 2025

[29] Rs. 50 mln worth foreign cigarettes seized in largest-ever smuggling attempt at BIA, ADA Derana, 2025

[30] නිදසුනක් ලෙස vapehubsrilanka වෙබ්අඩවිය, සහ Vape HUB Sri Lanka ෆේස්බුක් පිටුව බලන්න.

[31] ශ්‍රී ලංකා රේගුවෙන් මිලදී ගැනීම සඳහා වෙළඳ සහ ආනයන සංඛ්‍යාලේඛන මෙතැනින් ලබා ගත හැකිය. මෙම දත්තවලින් පෙනී යන්නේ කිසිදු වේප් නිෂ්පාදනයක් නීත්‍යානුකූලව රටට ආනයනය කර නොමැති බවයි.

**රූප සටහන 1:** නීති විරෝධී වේප් නිෂ්පාදන තරුණ පරපුර ඉලක්ක කරගනිමින් ප්‍රචාරණය කර ඇති විවිධ අන්තර්ජාල වෙළඳ දැන්වීම් පිළිබඳ උදාහරණ[32]




# ජාත්‍යන්තර නීති විරෝධී වෙළඳපොළවල පරිමාණය

වේප් නිෂ්පාදන තහනම් කර ඇති හෝ දැඩි ලෙස සීමා කර ඇති අනෙකුත් රටවල දක්නට ලැබෙන තත්ත්වය හා ශ්‍රී ලංකාවේ අත්දැකීම ද සමාන වේ. එවැනි පසුබිමකදී, පාරිභෝගිකයන් අතර පවතින නොනවතින ඉල්ලුම සපුරාලීම සඳහා නීති විරෝධී සැපයුම් දාමයන් වේගයෙන් වර්ධනය වන බවට නිරීක්ෂණය වී ඇත.

2009 වසරේ සිට වේප් නිෂ්පාදන අලෙවිය තහනම් කර ඇති බ්‍රසීලයේ[33], 2025 වසර වන විට නීති විරෝධී වෙළඳපොළේ වටිනාකම දළ වශයෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.03ක් පමණ වන බව නිකොටින් වෙළඳපොළ දත්ත සපයන 'ECigIntelligence' ආයතනය ඇස්තමේන්තු කර ඇත. ඒ හා සමානව, වේපින් නිෂ්පාදන 'විෂ වර්ග' ලෙස නම් කිරීම[34] ඇතුළුව විවිධ සීමාකාරී වර්ගීකරණයන්ට යටත් කර ඇති ඕස්ට්‍රේලියාවේ පවතින නීත්‍යානුකූල නොවන වෙළෙඳපොලෙහි වටිනාකම 2004 වසරේදී ඇමරිකානු ඩොලර් මිලියන 750 සිට ඇමරිකානු ඩොලර් බිලියන 1.3[35] අතර වන බව 2024 වසරේදී එරට පාර්ලිමේන්තුව සිදු කරන ලද පරීක්ෂණයකදී ඇස්තමේන්තු කර ඇති අතර ඕස්ට්‍රේලියාවේ සමස්ත වෙළඳපොළෙන් ඇස්තමේන්තු කර ඇති පරිදි 95.7% ක් නීති විරෝධී විකුණුම්වලින් සමන්විත වේ.[36]

[32] https://www.facebook.com/groups/568395012078967/


[33] RDC Resolution No. 46. Brazilian National Health Surveillance Agency, 2009

[34] ආසනික් (arsenic), ස්ට්‍රයික්නීන් (strychnine) සහ සයනයිඩ් (cyanide) වැනි ද්‍රව්‍ය ඇතුළත් කාණ්ඩයකි (Australian Government).


[35] E-Cigarette use in Victoria, Victoria Parliamentary Budget Office, 2024

[36] Illicit Tobacco and E-cigarette Commissioner Report 2024-25, Illicit Tobacco and E-cigarette Commissioner, 2025

**රූපය** 2A: ECigIntelligence ඇස්තමේන්තු අනුව බ්‍රසීලයේ වේප් නිෂ්පාදන වෙළඳපොළේ ප්‍රමාණය (USD මිලියනවලින්)





**රූපය** 2A: ECigIntelligence ඇස්තමේන්තු අනුව ඕස්ට්‍රේලියාවේ වෙ වේප් නිෂ්පාදන වෙළඳපොළේ ප්‍රමාණය (USD මිලියනවලින්)




නීත්‍යානුකූල සැපයුම් මාර්ග සීමා කළ විට, නීති විරෝධී වේප් නිෂ්පාදන වෙළඳපොළ කෙතරම් විශාල ප්‍රමාණයකට වර්ධනය විය හැකි ද යන්න මෙම දත්ත මගින් නිරූපණය කෙරේ. විශාල ප්‍රමාණයේ නීති විරෝධී වෙළඳපොළවල් පවතින විට, රජයට ලැබිය යුතු සැලකිය යුතු බදු ආදායමක් අහිමි වන අතර, ඒ වෙනුවට එම ආදායම ගලා යන්නේ නීති විරෝධී ක්‍රියාකාරීන් වෙතය. නිසි ලෙස නියාමනය කර බදු අය කළහොත්, වේප් නිෂ්පාදන වෙළඳපොළ මගින් මහජන සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන්, අධ්‍යාපන වැඩසටහන් සහ තරුණයන් ඉලක්ක කරගත් මර්දන වැඩසටහන් සඳහා සහය දීමට හැකි සැලකිය යුතු ආදායමක් උත්පාදනය කළ හැකිය. කෙසේ වෙතත්, මෙවැනි තහනම් යටතේ මෙම අරමුදල් ගලා යන්නේ රජයේ පාලනයෙන් බැහැරව ක්‍රියාත්මක වන අපරාධ ජාලයන් වෙතට ය.

නීති විරෝධී වෙළඳපොළෙහි තවත් අහිතකර ප්‍රතිඵලයක් වන්නේ වයස තහවුරු කිරීමේ ආරක්ෂණ ක්‍රමවේදයන් ක්‍රමයෙන් දුර්වල වීම ය. මෙම තහනම් කිරීම් මගින් තරුණයන්ගේ ප්‍රවේශය සීමා කරන යාන්ත්‍රණ ඉවත් කරනු ලබයි. බලපත්‍රලාභී සිල්ලර වෙළෙන්දන් නියාමනය කිරීමට සහ අධීක්ෂණය කිරීමට හැකි වුවද, නීති විරෝධී විකුණුම්කරුවන් සම්බන්ධයෙන් එසේ කළ නොහැක. දැනටමත් නීතියෙන් බැහැරව කටයුතු කරන වෙළෙන්දන්ට විකුණුම් වයස් සීමාවන් පැනවීමට වැඩි උනන්දුවක් නොමැති බැවින්, බාලවයස්කාර පාරිභෝගිකයින්ට වේප් නිෂ්පාදන ලබා ගැනීම පහසු වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, තහනම් කිරීම් මගින් බොහෝ විට සිදුවන්නේ වේප් නිෂ්පාදන සඳහා තරුණයන්ට ඇති ප්‍රවේශය අඩු වීම වෙනුවට එය තවදුරටත් වැඩි වීමයි. අනෙකුත් රටවල් වලින් ලැබෙන සාක්ෂි මෙම අවදානම පැහැදිලිවම සනාථ කරයි. ඕස්ට්‍රේලියාවේ, වයස අවුරුදු 14-17 අතර තරුණයින්ගෙන් 14.5%ක් තරම් ප්‍රමාණයක් 2023 වසර වන විට වේප් භාවිතා කරන බව වාර්තා වී ඇත.

**රූපය 3: ඕස්ට්‍රේලියාවේ වයස අවුරුදු 14–17 අතර තරුණයන් අතර වර්තමාන (අවම වශයෙන් මසකට එක් වරක්වත්) වේප් භාවිතා කිරීමේ අනුපාත**[37]




මේ ආකාරයෙන්ම, බ්‍රසීලයේ, 2024 වසරේ සිදු කරන ලද සමීක්ෂණයකට අනුව, එහි දත්ත මගින පෙනීයන්නේ වයස අවුරුදු 14-17 අතර යෞවන වයසේ පසුවන 11 දෙනෙකුගෙන් 1 අයෙකු වේප් නිෂ්පාදන භාවිතා කරන බවයි[38]. එය ආසන්න වශයෙන් යෞවනයන් මිලියන 1.1ක් පමණ වන අතර, එම ව්‍යාප්තියේ අගය වැඩිහිටියන් අතර දක්නට ලැබෙන අගයට වඩා කැපී පෙනෙන ලෙස ඉහළ මට්ටමක පවතී.

ශ්‍රී ලංකාවේ තරුණ පරපුර අතර වේප් භාවිතය පිළිබඳ සම්පූර්ණ ජාතික දත්ත තවමත් සීමිත වුවද, ඒ පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ සලකුණු දැනටමත් මතු වෙමින් පවතී. 2023 වැනි මුල් කාලයකදී සෞඛ්‍ය අමාත්‍යාංශය අනතුරු අඟවා සිටියේ, "විද්‍යුත් සිගරට් (E-Cigarettes) අන්තර්ජාලය සහ සමාජ මාධ්‍ය වේදිකා හරහා ප්‍රසිද්ධියේ අලෙවිකරණය සහ විකිණීම සිදු කරන අතර, ශ්‍රී ලාංකික තරුණ තරුණියන් අතර විද්‍යුත් සිගරට් භාවිතය ක්‍රමයෙන් ජනප්‍රිය වෙමින් පවතින බවයි" යනුවෙනි.[39] 2024 වසරේදී මෙම ගැටලුව නැවත වරක් මතුවිය.[40] එම වසරේදීම, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදුවීමක් විස්තර කරමින් කියා සිටියේ, ශිෂ්‍යයෙකු විසින් පාසලට නීති විරෝධී වේප් නිෂ්පාදනයක් රැගෙන විත් අනෙකුත් සිසුන්ට එහි එක් 'ඇදීමක්' (puff) සඳහා රුපියල් 20 බැගින් අය කළ බවයි.[41] 2025 වන විට වාර්තා මගින් පෙන්වා දුන්නේ දිවයින පුරා සිටින බාලවයස්කාර පාරිභෝගිකයින් නීති විරෝධී වේප් නිෂ්පාදන භාවිතා කරන බවයි.[42]

නියාමනයෙන් සහ අපරාධ යුක්ති ක්‍රමවේදයෙන් ඇති බලපෑම් ඉක්මවා යමින්, නීත්‍යානුකූල නොවන වෙළෙඳපල ව්‍යාප්ත වීම මගින් සැලකිය යුතු ලෙස මහජන සෞඛ්‍ය කෙරෙහි අවදානමක් නිර්මාණය වේ. නීත්‍යානුකූල සැපයුම් මාර්ග සම්පූර්ණයෙන් ඉවත් කර ඇති විට, පාරිභෝගිකයින් වේප් නිෂ්පාදන ලබා ගැනීම සඳහා නීති විරෝධී මාර්ග භාවිත කිරීමට පෙළඹෙන අතර, එම නිෂ්පාදන වල අමුද්‍රව්‍යවල ප්‍රමිතීන්, නිෂ්පාදන පරීක්ෂණ අවශ්‍යතා හෝ නිෂ්පාදන පාලන ක්‍රමවේදයන් සපුරාලීමක් සිදුවන්නේ නැත.

අවිධිමත් මාර්ග හරහා නීති විරෝධී ලෙස ගෙන එන සහ අන්තර්ජාල වේදිකා හෝ බලපත්‍ර රහිත සිල්ලර වෙළෙන්දන් හරහා අලෙවි කරනු ලබන නිෂ්පාදනවල හඳුනා නොගත් රසායනික ද්‍රව්‍ය, ප්‍රමිතීන්ට අනුකූල

---

[37] https://ggtc.world/knowledge/novel-emerging-tobacco-products-and-product-regulation/current-vaping-and-smoking-in-the-australian-population-aged-14-years-or-older-february-2018-to-march-2023

[38] Thematic notebook LENAD III - Tobacco and Electronic Smoking Devices in the Brazilian Population: Results in 2023, 2025

[39] Weekly Epidemiological Report, Sri Lanka Ministry of Health, Nutrition & Indigenous Medicine, 2023

[40] Warning for parents regarding E-Cigarettes: Increased usage among children and youth, HIRU News, 2024

[41] Student of leading school at Ratnapura charged Rs 20 per puff of e-cigarette from schoolmates, The Island Online, 2024

[42] Why is SL Still Waiting to Ban Vaping? Ceylon Today, 2025

නොවන ලෙස මිශ්‍ර කළ නිකොටීන් හෝ වෙනත් හානිකර ද්‍රව්‍ය අඩංගු විය හැකිය. අධීක්ෂණය, ගුණාත්මක පාලනය සහ හඳුනාගැනීමේ හැකියාවක් (traceability) නොමැති වීම හේතුවෙන්, බාලවයස්කාර පරිශීලකයින් ඇතුළු පාරිභෝගිකයින්ට, නියාමනය කළ වෙළඳපොළක දක්නට නොලැබෙන සැලකිය යුතු සෞඛ්‍ය අවදානම්වලට මුහුණ දීමට සිදු විය හැකිය.

සාපේක්ෂව හුදෙකලා දූපත් රාජ්‍යයක් වන සහ දේශසීමා පාලනය හා බලාත්මක කිරීම සඳහා වාර්ෂිකව ඩොලර් බිලියන භාගයක් පමණ මුදලක් ආයෝජනය කරන ඕස්ට්‍රේලියාවට පවා මෙම නීති විරෝධී නිෂ්පාදන රැල්ල පාලනය කිරීමට නොහැකි වී ඇත්නම්, ශ්‍රී ලංකාව ද එම තහනම් කිරීමේ මාවත ම අනුගමනය කළහොත් ඊට සමාන හෝ තවත් අහිතකර ප්‍රතිඵල අත්කර ගැනීමේ අවදානමක් පවතින බව මින් තර්කානුකූලව පැහැදිලි වේ.

# ඉදිරි ගමන් මග

පවතින සාක්ෂි සියල්ල ඒකාකාරී වේ. එනම්, මෙම තහනම් කිරීම් මගින් මෙම නිෂ්පාදන වලට ඇති ඉල්ලුම සම්පූර්ණයෙන් නතර වීමක් සිදු නොවන අතර, සිදු වන්නේ එම ඉල්ලුම නියාමනයක් නොමැති, ආරක්ෂණ ප්‍රමිතීන් සහ වයස් සීමාවන් අදාළ නොවන නීති විරෝධී වෙළඳපොළවල් වෙත යොමු වීමයි.

ශ්‍රී ලංකාව සහ මෙම වාර්තාවේ සමාලෝචනය කරන ලද අනෙකුත් රටවල්වල අත්දැකීම් මගින් ස්ථාවර ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ඉගැන්වීමක් අවධාරණය කෙරේ: එනම් වේප් නිෂ්පාදන තහනම් කිරීමට දරන උත්සාහයන් මගින් එම නිෂ්පාදන වලට ඇති ඉල්ලුම තුරන් වන්නේ ඉතා කලාතුරකිනි. ඒ වෙනුවට, එමගින් පරිභෝජනය නියාමන අධීක්ෂණයක් නොවන, නිෂ්පාදන ප්‍රමිතීන් සහ වයස තහවුරු කිරීමේ ක්‍රමවේදයන් නොමැති නීත්‍යානුකූල නොවන වෙළෙඳපල වෙත නැඹුරු වීම සිදු වේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, බලධාරීන්ට වෙළඳපොළ පිළිබඳ පවතින නිරීක්ෂණ කිරීමේ හැකියාව අහිමි වන අතර, පාරිභෝගිකයින් නියාමනය නොකළ නිෂ්පාදනවලට නිරාවරණය වන අතරම, නීති විරෝධී විකුණුම්කරුවන්ට නීතියේ ග්‍රහණයෙන් බැහැරව ක්‍රියාත්මක වන වෙළඳාමකින් ලාභ ලැබීමට අවස්ථාව සැලසේ.

ජාත්‍යන්තර අත්දැකීම් අනුව, විකල්ප ප්‍රවේශ මගින් සැලකිය යුතු ලෙස වෙනස් ප්‍රතිඵල ලබා ගත හැකි බව පෙනී යයි. එක්සත් රාජධානිය සහ නවසීලන්තය වැනි රටවල්, දැඩි දුම්කොළ පාලන ක්‍රියාමාර්ග සහ අඩු අවදානමකින් යුතු නිකොටීන් විකල්ප නිෂ්පාදන සඳහා නියාමනය කරන ලද ප්‍රවේශයන් ඒකාබද්ධ කරන ලද නියාමන රාමුවන් අනුගමනය කර ඇත. පැහැදිලි නීතිමය රාමුවක් තුළ නියාමනය කරන ලද වේප් නිෂ්පාදන, සිගරට් නිෂ්පාදන සමඟ තරග කිරීමට ඉඩ දීමෙන්, පාරිභෝගික ආරක්ෂණය දැඩි ලෙස පවත්වා ගැනීමටත්, ගෝලීය වශයෙන් වාර්තා වන අවම දුම්පාන අනුපාතයන් කරා ළඟා වීමට දායක වීමටත් මෙම රටවල්වල හැකියාව ලැබී ඇත.


මෙහි පවතින වෙනස ඉතාම පැහැදිලිය. අවදානම අඩු නිෂ්පාදන සම්බන්ධයෙන් නියාමනය සිදු කරන රටවල දුම්පානය සිදු කරන පිරිස ශීඝ්‍රයෙන් පහත වැටෙමින් පවතී. මෙම නිෂ්පාදන තහනම් කරන රටවල්වල නීති විරෝධී වෙළඳපොළ  ව්‍යාප්ත වන අතර දුම්පානය පහත වැටීම ඉතා මන්දගාමී වේ. මෙම ප්‍රතිඵලය අහඹුවක් නොවන අතර, එය ආරක්ෂිත විකල්ප නිෂ්පාදන, සිගරට් නිෂ්පාදන සමඟ තරග කිරීමට ඉඩ ලබා දීම සහ එය ප්‍රතිස්ථාපනය කිරීමට ඉඩ සැලසෙන පරිදි හිතාමතාම සකස් කරන ලද නියාමන සැලසුම්වල ප්‍රතිඵල වේ. එක්සත් රාජධානියේ සහ නවසීලන්තයේ යන රටවල් දෙකෙහිම, දැඩි ගුණාත්මක සහ ආරක්ෂිත ප්‍රමිතීන් සපුරාලන නිෂ්පාදන පෙළක් සඳහා වැඩිහිටියන්ට ප්‍රවේශ විය හැකි බව සහතික කරන බැවින් නියාමනය වූ නීත්‍යානුකූල වෙළඳපොළක් පවතී.[43] [44]එසේම තවත් වැදගත් කරුණක් වනුයේ, මෙම රටවල් දෙකෙහි ම මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් සිදු කරන සන්නිවේදන මගින් වේප් කිරීම සහ දුම්පානය අතර පවතින සාපේක්ෂ අවදානම් පිළිබඳව ඵලදායී ලෙස

[43] Regulation of Vaping, herbal smoking and smokeless tobacco, New Zealand Ministry of Health, 2025


[44] E-cigarettes: regulations for consumer products, UK Government, 2024

සන්නිවේදනය කරමින්[45 46] විකල්ප නිෂ්පාදන වෙත යොමු වීම දිරිමත් කරන අතර, වෙළඳපොළේ නීත්‍යානුකූල ස්වභාවය නිසා තරුණයන්ගේ ප්‍රවේශය සීමා කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට සහ බලාත්මක කිරීමට බලධාරීන්ට හැකියාව ලැබී තිබේ.[47]

**රූපය 4A:** නවසීලන්තයේ වර්තමාන (එනම් මසකට අවම වශයෙන් එක් වරක්වත්) දුම්පානය (කළු) සහ වේප් භාවිතය (රතු) අනුපාත[48]




**රූපය 4B:** එක්සත් රාජධානියේ වර්තමාන (එනම් මසකට අවම වශයෙන් එක් වරක්වත්) දුම්පානය (කළු) සහ වේප් භාවිතය (රතු) අනුපාත[49 50]




ශ්‍රී ලංකාව මේ අවස්ථාවේ දී පැහැදිලි තෝරාගැනීමකට මුහුණ දී සිටී: එනම් මේ වන විටත් අසාර්ථක වෙමින් පවතින තහනම් කිරීමේ ආකෘතිය දිගටම කරගෙන යාම හෝ සාක්ෂි මත පදනම්ව සහ ජාත්‍යන්තර වශයෙන්

45 Vaping Myths and the Facts, UK National Health Service, 2024

46 Vaping Facts, New Zealand Ministry of Health, 2025

47 More officers on streets to smoke out illicit tobacco and vapes, UK Government, 2025

48 https://www.health.govt.nz/publications/annual-update-of-key-results-202324-new-zealand-health-survey

49 https://www.ons.gov.uk/peoplepopulationandcommunity/healthandsocialcare/healthandlifeexpectancies/bulletins/adultsmokinghabitsingreatbritain/2023

50 https://ash.org.uk/uploads/Use-of-vapes-among-adults-in-Great-Britain-2024.pdf

සාර්ථක ලෙස භාවිතා වන පදනම මත නිසි නියාමන රාමුවක් අනුගමනය කිරීමයි. මෙවැනි ප්‍රවේශයක් අනුගමනය කිරීම දුම්පානය හා සම්බන්ධ දිගුකාලීන සෞඛ්‍ය ගැටලු අඩු කර ගැනීමට ලැබෙන සුවිශේෂී අවස්ථාවක් විය හැකිය. ජාත්‍යන්තර ආකෘතිකරණ අනුව පෙනී යන්නේ, හානි අවම කිරීමේ උපායමාර්ග දුම්කොළ පාලන ප්‍රතිපත්තිවලට ඇතුළත් කිරීමෙන් සැලකිය යුතු මහජන සෞඛ්‍ය ප්‍රතිලාභ අත්කර ගත හැකි බවයි. මෑතකදී කරන ලද එක් විශ්ලේෂණයකින් ඇස්තමේන්තු කර ඇත්තේ, දීර්ඝ ලෙස දුම්පානය කිරීමට පෙළඹෙන පුද්ගලයින්ට ඒ වෙනුවට සැලකිය යුතු ලෙස අවදානම අඩු නිකොටින් විකල්ප වෙත මාරු වීමට අවස්ථාව සැලසෙන්නේ නම්, 2060 වසර වන විට ශ්‍රී ලංකාව තුළ ජීවිත 85,000ක් පමණ බේරා ගැනීමට හැකියාව ඇති බවයි.[51]

මෙම ප්‍රතිලාභ යථාර්ථයක් කරගැනීම සඳහා වර්තමානයේ පනවා ඇති තහනම් කිරීමේ ප්‍රවේශයෙන් ඔබ්බට ගොස්, පැහැදිලි සහ බලාත්මක කළ හැකි නියාමන පද්ධතියක් ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. එවැනි නියාමන රාමුවකට පහත කරුණු ඇතුළත් විය යුතු ය:

- සාම්ප්‍රදායික සිගරට් සහ වේප් නිෂ්පාදන අතර පැහැදිලි වෙනසක් තහවුරු කරන පැහැදිලි නීතිමය නිර්වචනයන් සකස් කරමින්, ඒ නිෂ්පාදන භාවිතය සමඟ සම්බන්ධ අවදානමට අනුපාතික වන නියාමනයන් ක්‍රියාත්මක කිරීම.
- සියලු සිල්ලර වෙළඳ බෙදාහැරීමේ මාධ්‍යන් තුල විකිණීමට අදාළ වයස් සීමාවන් දැඩි ලෙස බලාත්මක කිරීම
- නිෂ්පාදන සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය, නිෂ්පාදන ක්‍රියාවලිය සහ නිස්සාරණ (emissions) පාලනය කරන ශක්තිමත් නිෂ්පාදන ආරක්ෂණ ප්‍රමිතීන් සහ පරීක්ෂණ අවශ්‍යතා පැවතීම.
- වැඩිහිටි පාරිභෝගිකයන්ට නොව, නීති විරෝධී සැපයුම්කරුවන් ඉලක්ක කරගත් නීතිමය ක්‍රියාමාර්ග සඳහා පියවර ගැනීම
- භාවිතය සමඟ සම්බන්ධ අවදානමට අනුපාතික වන ලෙස නිකොටීන් නිෂ්පාදන මත බදු පැනවෙන, අවදානමට අනුපාතික සමතුලිත බදු ව්‍යුහයක් ඇති කිරීම.
- දහනය කළ හැකි දුම්කොළ (combustible tobacco) භාවිතයෙන් ඉවත් වීමට සහය වන පරිදි වැඩිහිටියන් ඉලක්ක කරගත් රසවර්ග පරාසයක් අනුමත කිරීම.
- පාරිභෝගිකයන් දැනුවත් තේරීම් කිරීමට හැකි වන පරිදි මේ හා සම්බන්ධිත අවදානම් පිළිබඳ නිවැරදි සන්නිවේදනය තහවුරු කිරීම සහ දුම්කොළ හානි අවම කිරීම සඳහා සහාය වීම

අඩු අවදානම් සහිත විකල්ප නිෂ්පාදන සඳහා සුරක්ෂිත ප්‍රවේශයක් ලබා දීමෙන් එය නිසි ලෙස නියාමන කිරීම මගින් දුම්පානය ආශ්‍රිත හානි අවම කිරීමටත්, පාරිභෝගික ආරක්ෂාව වැඩි දියුණු කිරීමටත්, දැනට නීතියෙන් බැහැරව පවතින වෙළඳපොළක් කෙරෙහි නියාමන පාලනය නැවත ඇති කිරීමටත් හැකි වනු ඇත.

අවසාන වශයෙන්, නිකොටීන් නිෂ්පාදන අතර පවතින අවදානම් අඛණ්ඩතාව හඳුනාගෙන, සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සහ ඒ අනුව ඒවා නියාමනය කරමින්, දුම්පානය හා සම්බන්ධ හානි අවම කිරීම සඳහා, තහනම් කිරීම් සමඟ ඇති විය හැකි අනපේක්ෂිත අහිතකර ප්‍රතිවිපාක මඟහැර, විශ්වාසදායක එකම මාර්ගය ලෙස ක්‍රියාත්මක විය හැක.

[51] Lives Saved Report: Potential Public Health Impact of Tobacco Harm Reduction in Sri Lanka, 2025

"අඩු අවදානම් සහිත විකල්ප නිෂ්පාදන සඳහා ප්‍රවේශය සුරක්ෂිත කරන අතරම නිසි නියාමන අධීක්ෂණයක් පවත්වා ගැනීම වැනි ප්‍රවේශයන් මගින් දුම්පානය ආශ්‍රිත හානි අවම කිරීමටත්, පාරිභෝගික ආරක්ෂාව වැඩි දියුණු කිරීමටත්, දැනට නීතියෙන් බැහැරව පවතින වෙළඳපොළක් කෙරෙහි නියාමන පාලනය නැවත ඇති කිරීමටත් හැකි වනු ඇත."

@pdnwmedia

@prohibitiondoesnotwork

prohibition does not work

www.prohibitiondoesnotwork.com

PROHIBITION

DOES NOT WORK